47

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී ස්වභාවික විද්‍යා ගෞරව උපාධි වැඩසටහන

පස්වන මට්ටම - 2021/2022

අවසාන පරීක්ෂණය 2022

**STU5512- අධ්‍යාපනයේ පදනම**

කාලය පැය තුනයි. (03)

---

දිනය - 2022.12.02 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. ෆවුරේ වාර්තාවේ අධ්‍යාපනය හැඳින්වූයේ "දිවි පැවැත්ම සඳහා ඉගෙනුම" යනුවෙනි. එයින් අදහස් කරන්නේ කුමක් ද? උදාහරණ දෙකක් (02) සපයන්න.

02. ජීන් ජැක් රූසෝ විසින් ඉදිරිපත් කරන ලද ළමයෙක් අධ්‍යාපනය ලැබිය යුතු මාධ්‍යයන් තුන (03) නම් කරන්න.

03. "ද්විතීයික සමාජානුයෝජනය" යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?

04. යහපත් ජීවන දර්ශනයක ලක්ෂණ තුනක් (03) දක්වන්න.

05. නූතන ඇමෙරිකානු පවුල් පිළිබඳ විශ්ලේෂණයේ දී ටැල්කොට් පාර්සන්ස් (Talcott Parsons) 1965 තර්ක කරන්නේ සෑම සමාජයක ම පවුලට පොදු "මූලික සහ අඩු කළ නොහැකි කාර්යයන්" දෙකක් පවුල රඳවාගෙන ඇති බවයි. ඒ මොනවා ද?

06. "විධිමත් අධ්‍යාපනය" යන සංකල්පය සැකෙවින් පැහැදිලි කරන්න.

07. අධ්‍යාපනය ආයෝජනයක් ලෙස සැලකීමට හේතු තුනක් (03) දක්වන්න.

08. පුනරාවර්තන අධ්‍යාපනයේ ප්‍රධාන අපේක්ෂාව කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05x 08 = 40)

## 2 වන කොටස

09. (i) ඩෙලෝස් වාර්තාවේ සඳහන් වන අධ්‍යාපනයේ ස්ථම්භ හතර (04) මොනවා ද? (ලකුණු 04)

(ii) සිසුන් තුළ සමබර පෞරුෂයක් ගොඩනැගීම සඳහා ඉහතින් සඳහන් කළ අධ්‍යාපනයේ ස්ථම්භ හතර වැදගත් වන්නේ කෙසේදැයි සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(iii) අද ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන අධ්‍යාපන ක්‍රමය පුද්ගලයාගේ අත, හිස සහ හදවත සංවර්ධනය කිරීමට ඉවහල් වන්නේ කෙසේද යන්න විභාග කරන්න. (ලකුණු 08)

10. (i) ජෝන් ඩූවීගේ අධ්‍යාපන දර්ශනයේ ලක්ෂණ තුනක් (03) දක්වන්න. (ලකුණු 03)

(ii) ශ්‍රී ලාංකික සන්දර්භය තුළ විෂයමාලා සැකසීමේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී ජෝන් ඩූවීගේ විෂයමාලාව පිළිබඳ අදහස් කෙතරම් දුරට වැදගත් වේදැයි විභාග කරන්න. (ලකුණු 08)

(iii) "වර්තමාන සමාජය විභාග සමත් කිරීම හැර සාරධර්ම අධ්‍යාපනයේ වැදගත්කම නොදැකීම නිසාවෙන් ජීවන අභියෝගයන්ට මුහුණ දීමේ ගැටලුවලට මුහුණ දෙමින් සිටී."

ඔබ ඉහත ප්‍රකාශය හා එකඟ වන්නේ ද? උදාහරණ තුනක් (03) ගෙන ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 09)

11. (i) 'ප්‍රජානන අරමුණු' හා 'ආවේදන අරමුණු' යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) සමාජ වෙනස්වීම් සමඟ අධ්‍යාපන අරමුණු වෙනස්විය යුතු ඇයිදැයි උදාහරණ දෙකක් (02) ගෙන විස්තර කරන්න. (ලකුණු 08)

(iii) අධ්‍යාපනික අරමුණු හා පරමාර්ථ ගොඩනැගීමේ අවශ්‍යතාව උදාහරණ හතරක් (04) ගෙන පැහැදිලි කරන්න. (ලකුණු 08)

12. (i) 'සමාජ ස්ථරායනය' යන සංකල්පය නිර්වචනය කරන්න. (ලකුණු 04)

(ii) පුද්ගලයන්ගේ ධනාත්මක සමාජ සඵලතාවක් ප්‍රවර්ධනය කිරීමේ දී අධ්‍යාපනය උදව් වන්නේ කෙසේද යන්න සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(iii) ළමයින්ගේ සමාජානුයෝජනයේ දී මාධ්‍ය වැදගත් භූමිකාවක් ඉටු කරන්නේ යැයි ඔබ සිතන්නේ ද? හේතු හතරක් (04) සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 08)

13. (i) සමාජානුයෝජනයේ වෙනස් කාරක හතරක් **(04)** නම් කරන්න. (ලකුණු 04)

(ii) විධිමත් අධ්‍යාපනයේ දුර්වලතාවලට ප්‍රතිකර්මයක් ලෙස නොවිධිමත් අධ්‍යාපනය ක්‍රියාකරන්නේ කෙසේද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) වැඩිහිටි අධ්‍යාපන සංවර්ධනයට අදාළ ක්‍රමෝපායන් හතරක් **(04)** විස්තර කරන්න. (ලකුණු 08)

14. පහත දැක්වෙන ඕනෑම මාතෘකා දෙකක් **(02)** පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

**i.** අධ්‍යාපනය හා ආර්ථික සංවර්ධනය
**ii.** විවෘත අධ්‍යාපනය
**iii.** විධිමත් අධ්‍යාපනයේ ශක්තීන්
**iv.** මහත්මා ගාන්ධිගේ අධ්‍යාපනික යෝජනා

(ලකුණු 20)

හිමිකම් ඇවිරිණි.